----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අඩ්ඩාලචෙනෙයි ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලචෙනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,434,888 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.	වර්ෂයට අදාල මුද්දර ගාස්තු අදාල මූල්‍ය වර්ෂයේදී ගණනය කිරීමේදී දුෂ්කරතාවයට මුහුණුපෑමට සිදුවී ඇති බව.	ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 18 ක්, මෝටර් වාහන හා ට්‍රැක්ටර් 21 ක් තක්සේරු කර වටිනාකම් ගිණුම්වල දක්වා නොතිබුණි.	තක්සේරු කර ගිණුම්වල දැක්වීමට කටයුතු කරනු ලබන බව.	ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තියේ 1 (අ) සහ (ආ) උප වගන්ති	සභාව විසින් නඩත්තු කරන වීදි සහ මාර්ගවල සිතියම් සකස් කිරීම සහ දැන්වීම් පළකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලබන බව.	පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති			
	(i) 5(xii) රීතිය	මුදල් සහ චෙක්පත්වල අත්සන් තබන, ආදායම් රැස්කරන නිලධාරීන් සහ ගබඩා භාණ්ඩ හා සම්බන්ධ නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිලධාරීන් කීපදෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගෙන තැන්පත් කර ඇත. අනිකුත් නිලධාරින්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇති බව.	මුල්‍ය, පරිපාලන රීති ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) 81 රීතිය	එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	දැනට අදාල කාල පරිච්ඡේදයේ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් යැවීමට කටයතු කර ඇති බව.	රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006			
	(i) 2.11 (අ) වගන්තිය	ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ මිල ගණන් සම්බන්ධයෙන් එකගතාවයන් සඳහා ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටුව ඒකාබද්ධව රැස්වීම් පවත්වා නොතිබුණි.	දැනට ඒකාබද්ධව රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇති බව.	මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii) 5.4.12 වගන්තිය	එකතු කළ අගය මත බදු ගෙවීමෙන් පසු ඒ සම්බන්ධ විස්තර ඉදිරි මාසයේ 15 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන් 04 දෙනෙකුට ගෙවා තිබු එකතු කළ අගය මත බදු රු.7,211,918 ක් සම්බන්ධ විස්තර ඉහත පරිදි දන්වා නොතිබුණි.	ඉදිරියේදි විගණකාධිපති වෙත දැන්වීමට කටයුතු කරනු ලබන බව.	- එම -

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 19,682,690 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 13,776,717 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
(i)	වරිපනම් හා බදු	250,000	198,170	198,170	-	350,000	167,235	167,235	-
(ii)	කුලී	8,000,000	6,826,740	4,023,690	2,803,050	13,975,000	11,625,839	8,901,169	2,724,670
(iii)	බලපත්‍ර ගාස්තු	1,427,000	1,155,375	1,056,375	99,000	1,372,000	1,133,450	1,010,450	123,000
(iv)	වෙනත් ආදායම්	21,815,000	21,179,726	20,162,820	1,016,905	20,805,000	20,431,478	19,469,592	961,885
	එකතුව	**31,492,000**	**29,360,011**	**25,441,055**	**3,918,955**	**36,502,000**	**33,358,002**	**29,548,446**	**3,809,555**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන පිළිබඳ නිරීක්ෂයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ටෙන්ඩර් මගින් බදු දීමෙන් ලැබිය යුතු රු.273,300 ක බදු කුලිය වර්ෂ 10 ක් ඉක්මවී තිබුණද, මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	අදාල පුද්ගලයන් හඳුනා ගැනීමට නොහැකි බැවින්, පොත්වලින් කපා හැරීමට කටයුතු කරනු ලබන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට හෝ අනුමැතිය ලබා ගෙන පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභා බලප්‍රදේශයේ පිහිටි වෙළඳ සැල් 101 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි.	බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය ලියවිලි වල තිබෙන අඩුපාඩු නිවැරදි කර මෙම වර්ෂයේ බලපත්‍ර ලබා දීමට කටයුතු කරනු ලබන බව.	අඩුපාඩු සම්පූර්ණ කර බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2020 වර්ෂයේ සිට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු.1,583,264 ක් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණද, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුද්දර ගාස්තු ඉල්ලුම් කිරීමට කටයුතු කර ඇති බව.	මුද්දර ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු කාබනික පොහොර නිෂ්පාදනාගාරය, කවශිමා යන්ත්‍රය සහ අනෙකුත් යන්ත්‍ර 2022 නොවැම්බර් 25 දින සිට මාසිකව රු.667,500 ක මාසික බදු මුදලකට ලබා දී තිබුණද, ජීවශක්ති කාබනික පොහොර පෞද්ගලික ආයතයෙන් ලැබිය යුතු රු.2,340,000 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි.	සභාව සතුව ඇති අත ඉතිරි පොහොර මලු 6,000 ක් විකුණා මුදල් ලබා ගැනීමට සහ අදාල ආයතනට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීමට තීරණය කර ඇති බව.	අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මොටර් වාහන සහ ගෘහ භාණ්ඩ වල වටිනාකම රු.310,241,817 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා තිබුණද, චංචල හා නිශ්චල වත්කම් ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ සහ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.	පරිගණක මෘදුකාංග මගින් යාවත්කාලීන කර ඇති අතර, ස්ථාවර වත්කම් ලේඛන යාවත් කාලීන කිරීමට කටයුතු කර ඇති බව.	කඩිනමින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	පරිත්‍යාග ලේඛනය නඩත්තු නොකිරීමෙන්, සභාව වෙත පරිත්‍යාග වශයෙන් ලැබුණු භාණ්ඩ සම්බන්ධයෙන් විගණනයේදි සෑහීමට පත් නොහැකි විය.	තොග ලේඛනයට ඇතුලත් කර ඇත. පරිත්‍යාග ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කර ඇති බව.	පරිත්‍යාග ලේඛනයක් කඩිනමින් ආරම්භ කළ යුතුය.
(ඇ)	සභාව සතුව පවතින වාහන 14 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අළුත්වැඩියා කළ නොහැකි වාහන වෙන්දේසි කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	ප්‍රමුඛත්වය අනුව අළුත්වැඩියා කරන අතර, ප්‍රයෝජනයට ගත නොහැකි වාහන පරිත්‍යාගශීලින්ගේ නම්වලින් තිබෙන බැවින්, වෙන්දේසි කිරීමේදී ප්‍රමාදයන් සිදුවන බව.	අළුත්වැඩියා කිරීමට නොහැකි වාහන වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබා ගැනීමේදී, සභා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 162 දෙනෙකුගෙන් පළුදු කරන ලද කොන්ක්‍රීට් හා තාර මාර්ගය නැවත සකස් කිරීම සඳහා රු.334,000 ක් තැන්පත් වශයෙන් ලබා ගෙන තිබුණු නමුත් එම මාර්ග සකස් කළ පසු තැන්පත් මුදල ආපසු ගෙවීමට සභාව වසින් කටයුතු කර නොතිබුණු.	අළුත්වැඩියා මුළුමනින් නිමකර ඇති මාර්ග සඳහාවූ තැත්පත් මුදල අදාල ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර ඇති අතර, ආපසු නොගෙවන තැන්පත් මුදල ආදායමට මාරු කිරීමට කටයුතු කර ඇත.	තැන්පත් මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතුය.
(ඉ)	අශ්රෆ් නගරයේ ඝණ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයක් පිහිටා තිබෙන ඉඩම සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර ඇති බව.	ඝණ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය පිහිටා තිබෙන ඉඩම සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයෙන් සහ වෙනත් ආයතන වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 07 ක අයිතිය සභාවේ නමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදි සභාවේ අනුමැතිය ලබා ගෙන අදාල වාහන සභාවේ නමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව.	වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති 128 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර ප්‍රාදේශීය සභා විසින් සැපැයීම් සහ සේවාවන් සහ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු කිරීම් සඳහා රු.24,374,508 ක් වැය කර තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටුයුතු කරනු ලබන බව.	අදාල පරිදි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සහ කාණු පද්ධති සකස් කිරීමේදි, නිසිපරිදි ජලය බැස යැමට හැකිවන පරිදි සැලැසුම් කර ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා 2023 වර්ෂයේ ඉදිකරන ලද මාර්ගවල ජලය රැඳී තිබීමෙන්, මාර්ග අනතුරු සිදුවීමට ඇති අවස්ථා බහුලව පවතින බව නිරීක්ෂණය විය.	නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	අදාල මාර්ග වල අඩුපාඩු කඩිනමින් නිවැරදි කළ යුතුය.
(ආ)	පුස්තකාලයේ විවිධ අංශය වන පුවත්පත් කියවීම් අංශය, කියවීම සඳහා පොත් නිකුත් කරන අංශය, ළමා අංශය, විද්‍යුත් පුස්තකාල අංශය, තොරුතුරු සෙවීමේ අංශය සහ ගබඩා අංශය යන අංශවලට අවශ්‍ය ඉඩ පහසුකම් නොමැතිව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.	ඉදිරියේදි සභා අරමුදලින් ඉහළ මහලයේ ඉදි කිරීමට කටයතු කරනු ලබන බව.	අදාල සේවාවන් සැපයීමට හැකි වන පරිදි ඉඩ පහසුකම් සහිත පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2015 දෙසැම්බර් 30 දිනැති 2016/01 අංක දරන මුදල් කොමිසම් සභාවේ චක්‍රලේඛයේ 1.2 වගන්තිය ප්‍රකාරව පළාත් සහ පළාත් පාලන සභාවලින් මාර්ග ඉදි කිරීමේදි බොරලු පස් දැමීම සහ තාවකාලික මාර්ග ඉදිකිරීම් සිදු නොකර දීර්ඝ කාලයක් ප්‍රයෝජනයට	මෙම මාර්ගයන් කඩිනමින් සකස්කරන ලෙස ගරු. ආණ්ඩුකාරතුමාගෙන් උපදෙස් ලැබුණු බැවින්, මෙය සිදු කර ඇති බව.	චක්‍රලේඛ අනුව, මාර්ග ඉදි කිරීමේදි බොරලු පස් දැමීම සහ තාවකාලික මාර්ග ඉදිකිරීම, සිදු නොකර දීර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගත හැකි

ගත හැකි පරිදි කාපට් දැමීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් දැමීම සිදු කළ යුතු බව සඳහන් කර තිබුණද, මෙම චක්‍රලේඛයට පටහැනිව සභා අරමුදල් යොදවා රු.2,525,523 ක වැයකර මාර්ග 05 ක් සඳහා බොරලු පස් යොදා තිබුණි.		පරිදි කාපට් දැමීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් දැමීම සිදු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව වසින් තිරායිකේනි ප්‍රදේශයේ රු.13,431,545 ක් වැය කර ළදරු පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර සභාවේ අනුමත සේවක සංඛ්‍යාව අනුව ළදරු පාසල් ගුරු තනතුරක් සඳහා පුරප්පාඩුවක් තිබුණද, එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.	සභාවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් සහ නැගෙනහිර පළාත් පාලන කොමසාරිස් මගින් දැනුම් දීමට කටයුතු කර ඇති බව.	ළදරු පාසල් ගුරු පුරප්පාඩු පුරවා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	සභාවේ සේවක ණය ලබා ගෙන මිය ගිය සේවයකුගෙන් රු.91,672 ක් අයවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.5,092 පමණක් අයකර ගෙන තිබුණි.	විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කිරීමට කටයුතු කරනු ලබන බව.	හිඟ සේවක ණය කඩිනමින් අයකර ගත යුතුය.

4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරින් 04 දෙනෙකු පත්කර තිබුණද, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය අනුව අභ්‍යන්තර විගණනයක් මගින් අස්ථිත්වයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්දේශ සකස්කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	අභ්‍යන්තර විගණනය මගින් අස්ථිත්වයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට හා ක්‍රියාකාරිත්වය නගාලීම සඳහා නිර්දේශ සකස් කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අයවැය ඇස්තමේන්තුව ඉකුත් කාලවල අයකළ ආදායම් සහ ආදායම් ප්‍රභවයන් නිසි පරිදි හඳුනා නොගැනීම හේතුවෙන් සියයට 0 සිට 50 දක්වා පරාසයකින් අයවැය ගත ආදායම්	ආදායම් අයකිරීම කාර්යක්ෂමව ක්‍රියාත්මක කර සම්පූර්ණ ආදායම රැස්කිරීමට කටයුතු කරනු ලබන බව.	ඉකුත් වර්ෂයේ තත්‍ය ආදායම් අනුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

වර්ග 11 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

4.3 පාරිසරික ගැටළු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 අංක 56 දරණ සහ 2000 අංක 53 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව පාරිසරික බලපත්‍ර අළුත් නොකර වෙළඳ ආයතන 53 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වෙළඳ කටයුතු වල යෙදී තිබුණි.	යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබන බව.	අදාල පනත අනුව පාරිසරික බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවේ ඝණ අපද්‍රව්‍ය රැස්කිරීම් මධ්‍යස්ථානය, ගව ඝාතනාගාරය, කවශිමා යන්ත්‍රාගාරය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා නොතිබුණි.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 තිරසාර සංවර්ධන ඉලක්ක

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සහ අරමුණු ලබා කර ගැනීමට අවශ්‍ය දර්ශකයන් හඳුනා ගෙන නොතිබුණි.	ඉදිරි වසර සඳහා පිළියෙල කරන අයවැය ලේඛනයේ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන ඉලක්ක, දර්ශක හඳුනා ගැනීම සහ ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.

4.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභා බලප්‍රදේශයේ රැස් කරන සහ වෙනත් සභාවලින් ලබා ගන්නා අපද්‍රව්‍ය දිරන සහ නොදිරන ලෙස වර්ගීකරණය නොකර එකම ස්ථානයේ බැහැර කර තිබුණි.	ඉදිරියේදි වර්ගීකරණය කර ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇති බව.	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දිරන අපද්‍රව්‍ය කාබනික පොහොර නිෂ්පාදන සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.